// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2415/61 - 2024 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී 5/2024

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වන වගන්තිය යටතේ වන නිවේදනය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනත ප්‍රකාරව, කලින් කල සංශෝධිත, 1934 පෙබරවාරි මස 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ, අංක 2310/07 සහ 2022 දෙසැම්බර් මස 12 වන දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් අවසන්වරට සංශෝධිත, 17 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 17 වන වගන්තිය, 17(1) වන වගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ, ''විශේෂඥ වෛද්‍ය නිලධාරී'' යන වචන වලින් ආරම්භව එහි අවසානය දක්වා වන සියලු වචන ඉවත් කිරීමෙන් ;

(3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

''(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, විශේෂඥ වෛද්‍යවරුන්ගේ, ශ්‍රේණිගත වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ, වෛද්‍ය පරිපාලන ශ්‍රේණිවල සියලුම නිලධාරීන්ගේ, විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු හැටතුන (63) විය යුතුය.''; සහ

(4) මේ නිවේදනයේ විධිවිධාන 2023 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක විය යුතු ය.

ආචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2024, දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0213

1A - G 43327 — 06 (2024/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*